රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

## 2026-03-23 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

### 01. බලශක්ති ආර්ථිකය සංවර්ධනය කිරීම පිළිබඳ විශේෂඥ කමිටුවක් පත් කිරීම

ජාතික ආර්ථිකයේ තිරසර වර්ධනයක් අත්කර ගැනීම සහ එය පවත්වාගෙන යාම සඳහා නව්‍ය මෙන් ම පුරෝකථනය කළ අනාගත ප්‍රවේශයන් ගවේෂණය කිරීමෙහි සහ ක්‍රියාවට නැංවීමෙහි වැදගත්කම රජය විසින් හඳුනාගෙන ඇත. ඒ අනුව, ප්‍රමුඛ ක්ෂේත්‍රයක් වශයෙන් බලශක්ති ආර්ථිකය හඳුනාගනු ලැබ ඇති නමුත්, ප්‍රධාන ආර්ථික අංශ අතර ඒකාබද්ධතාවයේ පවතින දුර්වලතා හේතුවෙන් එම ක්ෂේත්‍රයේ ආයෝජන සඳහා ඉදිරිපත් වීමේ පසුබෑමක් දක්නට ලැබේ. එම කරුණු සැලකිල්ලට ගනිමින්, තිරසර ආර්ථිකයක් ගොඩනැගීම සඳහා ඒකාබද්ධ ආර්ථික සංවර්ධන රාමුවක් පැවතීමේ අවශ්‍යතාව ගරු ජනාධිපතිතුමා විසින් 2026 වර්ෂය සඳහා වන අයවැය මඟින් අවධාරණය කරන ලදී. ඒ අනුව, ජාතික ප්‍රතිපත්ති, උපායමාර්ග සහ ප්‍රතිඵල ලබා දීමේ රාමු එකිනෙකට අනුකූල වන පරිදි බලශක්ති ආර්ථිකය සංවර්ධනය කිරීම සඳහා වන රාමුව සකස් කිරීම පිණිස ආචාර්ය හාන්ස් විජේසූරිය මහතාගේ සභාපතිත්වයෙන් යුතු ව විශේෂඥ කමිටුවක් පත් කිරීම සඳහා ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

### 02. ද්විතීයික අධ්‍යාපනය සඳහා තොරතුරු තාක්ෂණ කේන්ද්‍රස්ථාන ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීම

ශ්‍රී ලංකාවේ පාසල්වල තොරතුරු තාක්ෂණ අධ්‍යාපනය සහ අධ්‍යාපනය සඳහා තොරතුරු තාක්ෂණය භාවිතය විධිමත් කිරීමේ අරමුණින් 'ද්විතීයික අධ්‍යාපනය සඳහා තොරතුරු තාක්ෂණ කේන්ද්‍රස්ථාන ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය' කොරියානු EXIM බැංකුව යටතේ වන ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදල විසින් සපයනු ලබන ණය මුදලක් සහ ශ්‍රී ලංකා රජයේ අරමුදල් මඟින් ක්‍රියාත්මක කිරීම සඳහා 2018-06-05 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබේ. එම ව්‍යාපෘතිය යටතේ ජාතික මට්ටමේ ඉ-ඉගෙනුම් මධ්‍යස්ථානයක් සහ දකුණු පළාත සහ නැගෙනහිර පළාත සඳහා පළාත් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන දෙකක් ඉදි කිරීමට සැලසුම් කර ඇත. එමෙන්ම, සාමාන්‍ය අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන යන අංශ 03ම ආවරණය වන අයුරින් විධිමත් ඉ-ඉගෙනුම් ක්‍රමවේදයක් හඳුන්වා දීම පිණිස ඉ-ඉගෙනුම් වැඩසිළිවෙලක් නිර්මාණය කිරීම මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මඟින් අපේක්ෂා කරනු ලබයි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2019 නොවැම්බර් මාසයේදී අදාළ ගිවිසුම්වලට එළඹ ඇති නමුත්,

163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலபன எவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු තො T - (+94 11) 2515759
ෆැ பெ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

සැලසුම් කළ පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට හැකි වී නොමැත. සමස්ත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විද්වත් කමිටුවක් විසින් නැවත සමාලෝචනයක් සිදු කර ඉදිරිපත් කරනු ලැබ ඇති නිර්දේශ මත පදනම්ව එම ව්‍යාපෘතිය නැවත ආරම්භ කර ක්‍රියාත්මක කිරීම පිණිස අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 03. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා වූ ජාතික මෙහෙයුම් කමිටුවක් පත් කිරීම

2019 වර්ෂයේදී ආරම්භ කරන ලද නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය වත්මන් රජයේ ප්‍රතිපත්තිවලට අනුගත වන අයුරින් 2026 වර්ෂයේදී 1 ශ්‍රේණිය සඳහා ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලද අතර, 6 ශ්‍රේණිය සඳහා වන ප්‍රතිසංස්කරණ 2027 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අදාළ අඛණ්ඩ ක්‍රියාවලිය ඉදිරියට ක්‍රියාත්මක කිරීමට සහ එම ක්‍රියාවලිය නියාමනය කිරීමට හැකි වන පරිදි ක්ෂේත්‍රයේ විශේෂඥයින්ගෙන් සමන්විත මෙහෙයුම් කමිටුවක් පත් කිරීමේ අවශ්‍යතාව හඳුනාගනු ලැබ තිබේ. ඒ අනුව, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවක් සැලකිල්ලට ගනිමින් අදාළ අමාත්‍යවරුන්, ක්ෂේත්‍රයේ විශේෂඥයින්, නිලධාරීන්, වෘත්තිකයින් සහ වෘත්තීය සමිති නියෝජිතයින්ගෙන් සමන්විතව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා වූ ජාතික මෙහෙයුම් කමිටුව ස්ථාපිත කිරීම පිණිස අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී.

## 04. කෘෂිකාර්මික හා කර්මාන්ත අංශයේ තරුණ ව්‍යවසායකයින් සංවර්ධනය කිරීමේ ණය යෝජනා ක්‍රමය ඉදිරියට ක්‍රියාත්මක කිරීම

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව, වසර 05ක් තුළ ව්‍යවසායකයින් 50,000ක් බිහි කිරීම සඳහා මූල්‍ය පහසුකම් හා මඟ පෙන්වීම් ලබා දීමට රජය විසින් පියවර ගත යුතුව ඇත. ඒ අනුව, 2025 අයවැය යෝජනාවක් මඟින් එම අරමුණ ළඟා කර ගැනීමේ එක් පියවරක් වශයෙන් සහනදායී ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම පිණිස රුපියල් මිලියන 500ක අරමුදල් වෙන් කරන ලදී. කෘෂිකාර්මික හා කර්මාන්ත අංශයේ තරුණ ව්‍යවසායකයින් සංවර්ධනය කිරීමේ ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා එම මුදල යොදා ගැනීම පිණිස 2025-08-18 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබේ. එම ණය යෝජනා ක්‍රමය තවදුරටත් ක්‍රියාත්මක කිරීම පිණිස 2026 වර්ෂය සඳහා වන අයවැය මඟින් රුපියල් මිලියන 750ක ප්‍රතිපාදන වෙන් කරනු ලැබ ඇත. ඒ අනුව, 4%ක වාර්ෂික පොලී අනුපාතයක් යටතේ මහජන බැංකුව, ලංකා බැංකුව සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හරහා එකී ණය

යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමටත්, ඊට අදාළ මාර්ගෝපදේශ නිකුත් කිරීමටත් අදාළව සිය අමාත්‍යාංශය විසින් ගනු ලැබීමට සැලසුම් කර ඇති පියවරයන් පිළිබඳ කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග ඇමතිතුමා විසින් අමාත්‍ය මණ්ඩලයේ අවධානයට ඉදිරිපත් කරන ලදුව, ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ එකඟතාව ලබා දීමට තීරණය කරන ලදී.

05. **ශ්‍රී ලංකාවේ ජාතික සිවිල් ගුවන් සේවා ප්‍රධාන සැලැස්ම**

1944 වසරේදී පිහිටුවා ඇති ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් රාජ්‍යයන්වල ගුවන් සේවාවන්හි නිරුපද්‍රිතතාව, ආරක්ෂාව, කාර්යක්ෂමතාව, ධාරිතාව සහ පරිසර ආරක්ෂාවට අදාළ වන ජාතික රෙගුලාසි සැකසීමේ දී සහාය සලසමින් ගෝලීය ජාලයක් නිර්මාණය කිරීමට මග පෙන්වනු ලබයි. ගුවන් සේවා අංශය ඵලදායි ලෙස පවත්වාගෙන යාම සඳහා රාජ්‍යයකට පුළුල් සහ සැලසුම්කාරී ප්‍රවේශයක් තිබීම අත්‍යවශ්‍ය බව අවධාරණය කර ඇති එම සංවිධානය, ඒ සඳහා තීරණාත්මක මෙවලමක් ලෙස සිවිල් ගුවන් සේවා ප්‍රධාන සැලැස්මක් සම්පාදනය කළ යුතු බව ද පෙන්වා දී ඇත. එසේම, කොවිඩ් වසංගත තත්ත්වයෙන් පසුව ගුවන් සේවා කටයුතු යථා තත්ත්වයට පත්වීමේ සන්දර්භය තුළ ගුවන් සේවා පද්ධතිය සඳහා උපායමාර්ගික සංවර්ධන සැලසුම්කරණයේ අවශ්‍යතාව එම සංවිධානය විසින් අවධාරණය කරනු ලැබ ඇත. ඒ අනුව, ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් නිර්දේශිත පරිදි, අදාළ සියලුම පාර්ශ්වයන්ගේ සහභාගිත්වයෙන් යුතුව ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් ජාතික සිවිල් ගුවන් සේවා ප්‍රධාන සැලැස්ම පිළියෙල කරනු ලැබ තිබේ. එකී සැලැස්ම ක්‍රියාවට නැංවීම පිණිස වරාය සහ සිවිල් ගුවන් සේවා ඇමතිතුමා ඉදිරිපත් කරන ලද යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

06. **මහියංගනය මූලික රෝහල සංවර්ධනය කිරීම සඳහා සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතට පවරා ගැනීම**

'ඒ' කාණ්ඩයේ මූලික රෝහලක් වන මහියංගනය රෝහල ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයෙහි පිහිටි තෙවන විශාලතම රෝහල වේ. මේ වන විට ඌව පළාත් සභාව යටතේ පාලනය වන එම රෝහල අවට දිස්ත්‍රික්ක 06ක 500,000 ක් පමණ වූ ජනතාවට සෞඛ්‍ය සේවා සපයයි. 'දිට්වා' සුළි කුණාටුව හේතුවෙන් එම රෝහලේ ගොඩනැගිලිවලට දැඩි හානි සිදු වූ අතර, වෛද්‍ය සහ වෛද්‍ය නොවන උපකරණවලට සිදු වූ හානි හේතුවෙන් සායනික සේවාවන් සැපයීමේදී සැලකිය යුතු බාධාවන් මතු වී තිබේ. එසේම, රෝහල කළමනාකරණයේදී සහ වැඩි වන සෞඛ්‍ය සේවා ඉල්ලුම් සපුරාලීමේදී එහි යටිතල පහසුකම් තවදුරටත් සංවර්ධනය කිරීම ඌව පළාත් සභාවට අභියෝගයක් වී ඇත. එම කරුණු සැලකිල්ලට ගනිමින්, තෘතීයික

මට්ටමේ සත්කාර සැපයීම සඳහා මහියංගනය මූලික රෝහලේ පහසුකම් සංවර්ධනය කිරීමට හැකි වන පරිදි ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ එකඟතාව මත, එම රෝහල ජේෂ්ඨ සෞඛ්‍ය අමාත්‍යාංශය යටතට පවරා ගැනීම පිණිස සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 07. රජයේ පාසල්වල ක්‍රීඩාපිටි සංවර්ධනය කිරීම සඳහා වන ව්‍යාපෘතිය

තරගකාරී අධ්‍යාපන ක්‍රමය තුළ විභාග කේන්ද්‍රීය අධ්‍යාපන රටාවකට හුරු වීම සහ ප්‍රමාණවත් යටිතල පහසුකම් නොමැති වීම ක්‍රීඩා කටයුතු සඳහා පාසල් සිසුන්ගේ සහභාගිත්වය සතුටුදායක නොවන මට්ටමක පැවතීමට බලපා ඇති අතර, එම තත්ත්වය ඔවුන්ගේ ශාරීරික, සාමාජීය හා මානසික යහපැවැත්ම ප්‍රවර්ධනයේ දී ගැටලු නිර්මාණය කරන බව නිරීක්ෂණය කර ඇත. එසේ ම, එම තත්ත්වය ජාතික සහ ජාත්‍යන්තර මට්ටමේ දක්ෂතා දැක්විය හැකි විශිෂ්ට ක්‍රීඩක ක්‍රීඩිකාවන් හඳුනාගැනීමට ද බලපෑම් ඇති කරයි. රට තුළ පවත්නා රජයේ පාසල් 10,096ක් අතරින් 5%ක තරම් අඩු පාසල් ප්‍රමාණයක පමණක් සම්මත ප්‍රමාණයේ ක්‍රීඩා පිටි පවතින බව තහවුරු වී ඇති බැවින්, ක්‍රීඩාව සඳහා සිසුන්ට සමාන අවස්ථාවන් සලසා දීම සහතික කිරීම පිණිස සෑම අධ්‍යාපන කලාපයක් තුළම මීටර 400 ධාවන පථයක් සහිත සම්මත ප්‍රමාණයේ එක් ක්‍රීඩා පිටියක් හෝ ස්ථාපිත කිරීමේ අවශ්‍යතාව හඳුනාගනු ලැබ ඇත. ඒ අනුව, දිස්ත්‍රික්කයක එක් ජාතික පාසලක් සහ පළාත් පාසල් 3ක් බැගින් වන සේ දිස්ත්‍රික්ක 25ම ආවරණය වන පරිදි වසර 4ක් තුළ පාසල් 400ක ක්‍රීඩා පිටි සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය රුපියල් මිලියන 2010.50ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ 2026-2029 කාලසීමාව තුළ ක්‍රියාත්මක කිරීම පිණිස අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 08. පාසල් සිසුවියන් සඳහා සනීපාරක්ෂක තුවා ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම

පාසල් සිසුවියන්ගේ අඛණ්ඩ අධ්‍යාපනය තහවුරු කිරීමේ අරමුණින් වැඩිවියට පත් පාසල් සිසුවියන් සඳහා සනීපාරක්ෂක තුවා ලබා දීමේ වැඩසටහන, මෙම වසරේදී ද සියලුම රජයේ පාසල්වල 6 ශ්‍රේණියෙන් ඉහළ සහ රජයේ උපකෘත විශේෂ පාසල්වල වැඩිවියට පත් මිලියන 1.05ක් පමණ වූ සිසුවියන් සංඛ්‍යාවක් ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. ඒ අනුව, එක් සිසුවියකට රුපියල් 1,440/-ක් වන සේ රුපියල් 720/-ක වටිනාකමින් යුත් තිළිණ පත් දෙකක් බැගින් ලබා දීමටත්, සිය අභිමතය පරිදි රුපියල් 120/- බැගින් වූ තුවා 08ක් සහිත පැකට් 12ක් හෝ රුපියල් 180/- බැගින් වූ තුවා 10ක් සහිත පැකට් 08ක් වර්ෂය තුළ දී මිල දී ගැනීමට

අවස්ථාව සැලසෙන අයුරින් 2026 වසරේදී පාසල් සිසුවියන් සඳහා සනීපාරක්ෂක තුවා ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමටත් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**09. කොළඹ කොටුව දුම්රිය ස්ථානයේ මගී පහසුකම් වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම**

කොළඹ කොටුව දුම්රිය ස්ථානයේ මරදාන අන්තයේ සහ බම්බලපිටිය අන්තයේ මගී පාලම් ඉවත් කර විශේෂ අවශ්‍යතා ප්‍රවේශය සහිත නව පාලම් ඉදිකිරීම හා මගී පාලම සමඟ නව ප්‍රවේශපත්‍ර කවුළු ඉදිකිරීම සහ තෙමහල් සේවා ගොඩනැගිල්ල ඉදිකිරීම ඇතුළත් කොටුව දුම්රිය ස්ථානයේ මගී පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2025-06-02 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, අදාළ කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා සුදුසු ආයතනයක් තෝරා ගැනීම පිණිස ජාතික තරගකාරී ලංසු කැඳවීමේ ක්‍රමවේදය අනුගමනය කර ලංසු කැඳවා ඇත. ආයතන 04ක් විසින් ලංසු ඉදිරිපත් කර ඇති අතර, එකී ලංසු ඇගයීමෙන් අනතුරුව ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති නිර්දේශය මත පදනම්ව සාරානුකූල ප්‍රතිචාරාත්මක අවම ලංසුකරු වන M/s. MAGA Engineering (Pvt) Ltd වෙත රුපියල් මිලියන 2,162.64ක මුදලකට (බදු රහිත) එකී කොන්ත්‍රාත්තුව පිරිනැමීම පිණිස ප්‍රවාහන මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කරන ලද යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**10. යාපනය දිස්ත්‍රික්කයේ කුරිකාට්ටුවාන් ජැටිය වැඩිදියුණු කිරීම සහ පුනරුත්ථාපනය කිරීමේ කොන්ත්‍රාත්තුව පිරිනැමීම**

යාපනය දිස්ත්‍රික්කයේ කුරිකාට්ටුවාන් ජැටිය වැඩිදියුණු කිරීම සහ පුනරුත්ථාපනය සඳහා 2025-10-21 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. එම ප්‍රසම්පාදනය සඳහා ජාතික තරගකාරී ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් ලංසු කැඳවා ඇති අතර, ඒ සඳහා ලංසු 5ක් ලැබී තිබේ. එකී ලංසු ඇගයීමෙන් අනතුරුව ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති නිර්දේශය මත පදනම්ව M/s RR Construction (Pvt) Ltd වෙත රුපියල් මිලියන 984.73ක මුදලකට (බදු රහිත) එම කොන්ත්‍රාත්තුව පිරිනැමීම පිණිස ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 11. රජයේ මුද්‍රණාලයාධිපති තනතුරට පත් කිරීම

රජයේ මුද්‍රණාලයාධිපති තනතුරේ මේ වන විට සේවය කරනු ලබන එස්.ඩී.පාඩිකෝරාල මහතාගේ සේවා කාලය 2026-04-01 දිනෙන් අවසන් වීමට නියමිතය. 2013-06-26 දිනැති රජයේ මුද්‍රණ සේවා ව්‍යවස්ථාව අනුව මේ වන විට අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණ සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව තුළ නොමැත. එබැවින්, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව සැලකිල්ලට ගෙන, දැනට රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය රජයේ මුද්‍රණාලයාධිපති ලෙස සේවය කරනු ලබන මුද්‍රණ සේවයේ ජ්‍යෙෂ්ඨතම නිලධාරියා වන, එම සේවයේ I පන්තියේ II ශ්‍රේණියේ නිලධාරී ආර්.ජේ.පී.කේ.ජයරත්න මහතා, 2026-04-02 දින සිට ක්‍රියාත්මක වන පරිදි පූර්ණකාලීනව රජයේ මුද්‍රණාලයාධිපති තනතුරේ රාජකාරී ඉටු කිරීම සඳහා පත් කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

## 12. බස් ගාස්තු සංශෝධනය කිරීම

2026-03-22 දින සිදු වූ ලංකා සුදු ඩීසල් මිල වැඩිවීම බස් ගාස්තු සූචියට ගැළපූ විට වර්තමානයේ ක්‍රියාත්මක බස් ගාස්තුව 12.19%කින් වැඩි විය යුතු වේ. ඒ අනුව, 2026-03-23 මධ්‍යම රාත්‍රියේ සිට ක්‍රියාත්මක වන පරිදි සාමාන්‍ය සේවා, අර්ධ සුඛෝපභෝගී සේවා, සුඛෝපභෝගී සේවා සහ අධි සුඛෝපභෝගී සේවා (අධිවේගී හා සාමාන්‍ය මහාමාර්ගවල) බස් ගාස්තුව 12.19%කින් වැඩි කර ක්‍රියාත්මක කිරීම පිණිස ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති නිර්දේශය මත පදනම්ව ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 13. ජාතික QR ගෙවීම් භාවිත කිරීමේ වැඩසටහන වේගවත් කිරීම

ආර්ථික කාර්යක්ෂමතාව, මූල්‍ය අන්තර්ගතභාවය (Financial Inclusion) සහ මූල්‍ය විනිවිදභාවය ඉහළ නැංවීම සඳහා ඩිජිටල් ආර්ථිකය ප්‍රවර්ධනය කිරීම රජය විසින් ජාතික ප්‍රමුඛතාවක් ලෙස හඳුනාගනු ලැබ තිබේ. රට තුළ එදිනෙදා සිල්ලර ගනුදෙනු සඳහා අධික ලෙස මුදල් නෝට්ටු (Cash) භාවිත කරන අතර, එමඟින් විනිවිදභාවය සහ ඩිජිටල් ආර්ථිකයේ වර්ධනය සීමා වී ඇත. LankaQR යටිතල පහසුකම් මේ වන විට මූල්‍ය ආයතන 20කට අධික සංඛ්‍යාවක් සහ ජංගම දුරකතන යෙදුම 30කට ආසන්න ප්‍රමාණයක් සමඟ ක්‍රියාත්මකව පැවතුන ද, සාපේක්ෂව ඒවායේ සක්‍රිය භාවිතය අඩු මට්ටමක පවතී. 2025 වසරේ තුන්වන කාර්තුව තුළදී LankaQR හරහා දළ වශයෙන් ගනුදෙනු 274,000ක් වාර්තා වී ඇති අතර, එහි මුළු වටිනාකම රුපියල් බිලියන 1.18ක් පමණ වේ. එය සාමාන්‍යයෙන් මාසයකට

ගනුදෙනු 90,000ක් පමණ වන අතර, රුපියල් මිලියන 390ක පමණ වටිනාකමකි. ඒ අනුව, QR කේතය හරහා සිදු කරනු ලබන සාමාන්‍ය ගනුදෙනුවක වටිනාකම රුපියල් 5,000/-කට වඩා අඩු මට්ටමක පවතින බව නිරීක්ෂණය වේ. එම කරුණු සැලකිල්ලට ගනිමින්, ඒ සම්බන්ධයෙන් 2026 අයවැය මඟින් ඉදිරිපත් කරන ලද යෝජනාවට අනුගතව රුපියල් 5,000/-ට අඩු ගනුදෙනු සඳහා මුදල් යවන්නාට මෙන්ම ලබා ගන්නාට ද කිසිදු අමතර ගාස්තුවක් අය කිරීමකින් තොරව QR කේතය පදනම් කර ගත් ඩිජිටල් ගෙවීම් ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම පිණිස ඩිජිටල් ආර්ථික අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

14. ආපදා අවස්ථාවලදී ප්‍රතිචාර දැක්වීම සඳහා ආධුනික ගුවන්විදුලි හදිසි සන්නිවේදන ජාලයක් ස්ථාපනය කිරීම පිණිස ජපාන රජයේ සහාය ලබා ගැනීම

මෑතකාලීනව ඇති වූ ආපදා තත්ත්වයන්හිදී සාම්ප්‍රදායික සන්නිවේදන ජාල බිඳ වැටීම හේතුවෙන් හදිසි සේවා සහ මානුෂීය සේවා සැපයෙන ආයතන මඟින් ක්ෂණික ප්‍රතිචාර දැක්වීම සහ සහන මෙහෙයුම් කටයුතු සම්බන්ධීකරණය අඩාල වීම නිසා මුහුණ පෑමට සිදු වූ ගැටලු සැලකිල්ලට ගෙන, එවැනි අවස්ථාවලදී විකල්ප සන්නිවේදන ජාලයක් පැවතීමේ අවශ්‍යතාව හඳුනාගනු ලැබ ඇත. ඒ අනුව, සාම්ප්‍රදායික සන්නිවේදන ජාල ක්‍රියාත්මක නොවන හදිසි ආපදා අවස්ථාවලදී සන්නිවේදනයට සහාය කර ගැනීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා ගුවන්විදුලි සංගමය සමඟ සහයෝගයෙන් ආධුනික ගුවන්විදුලි සන්නිවේදන පද්ධති භාවිත කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට මූලික පියවර ගනු ලැබ ඇත. එම වැඩසටහනට අවශ්‍ය ආධුනික ගුවන්විදුලි සන්නිවේදන උපකරණ මිල දී ගැනීම සඳහා 'කලාපීය මානුෂීය ආරක්ෂක ව්‍යාපෘති සඳහා ආධාර ප්‍රදානය කිරීමේ වැඩසටහන' යටතේ ශ්‍රී ලංකාවේ ජපාන තානාපති කාර්යාලය හරහා ඇමෙරිකානු ඩොලර් 181,837ක ප්‍රදානයක් ලබා දීමට ජපාන රජය විසින් එකඟතාව පළ කර තිබේ. ඒ අනුව, එම ප්‍රදානය භාර ගැනීම සඳහා ජපාන රජය සමඟ ප්‍රදාන ගිවිසුමක් අත්සන් තැබීම පිණිස ඩිජිටල් ආර්ථික අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**********